## Abstract 12

# ගබ්සාවː බුදුදහමේ අර්ථ නිරූපණය

**පූජ්‍ය. හසලක සීලවිමල හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර - බෞද්ධ දර්ශනය),
*seelawimalah@gmail.com*

මෙම පර්යේෂණයෙන් අරමුණු කෙරෙන්නේ වර්තමානයේ අතිශය ගැටලුකාරී වූ ගබ්සාව පිළිබඳ අධ්‍යයනයකි. දරුගැබක් ප්‍රසූතියට පෙර කුසෙන් ඉවත් කොට විනාශ කිරීම ගබ්සාවේ දී සිදු කෙරේ. සෞඛ්‍ය හේතු හා සමාජ හේතු පදනම් කොට ගෙන ගබ්සාව නීතිගත කළ යුතු යැයි ඇතැමුන් තර්ක කළ ද ආගමික හා සදාචාර නියමයන් පරිදි ඇතැම්හු එය අනුචිත යැයි පවසති. බුදුසමය ජීවියෙකුගේ පහළ වීම පිළිබඳව **අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික** වශයෙන් උත්පත්ති ක්‍රම හතරක් පෙන්වා දෙයි. කලලයක් සංවර්ධනය වීම පිළිබඳ **සංයුත්තනිකායයේ ඉන්දක සූත්‍රයේ** දක්වෙන අතර ප්‍රථමයෙන් කලලය ඇති වීමත් පසුව **අබ්බුද, පේසි,ඝන, පසාඛ** අවස්ථාවන් කරා සතියෙන් සතිය විකාශනය වන අයුරුත් පෙන්වා දී ඇත. ඒ අනුව කලලය ද ජීවයක් බව හඳුනා ගෙන තිබේ. කුසෙහි ඇති කලලය කෙරෙහි පවා පාපී සිතකින් බැලීම අකුසලයක් බව බුදුසමය අවධාරණය කරයි. ප්‍රාණ, භූත ව්‍යවහාරයන් බුදුසමයේ දක්නට ලැබෙන අතර මෙයින් උපන් නූපන් සියලු සත්ත්වයන් අර්ථවත් වේ. ස්ත්‍රී දූෂණයකින් ඇති වූ ගැබ, අංග විකල ගැබ, බාල වයස්කාරියකව සිටිය දී පිහිටි ගැබ යනාදී ගැබ් ගබ්සා කිරීම සුදුසු යැයි සමාජය යෝජනා කරනුයේ සමාජාර්ථයෙන් මිස ආගමික හෝ විශ්ව විෂයික විඥානයකින් නොවේ. බුදුදහමේ කියැවෙන ධර්ම නීතිය අනුව සානුකම්පික නිරවද්‍ය කිරීම් නැත. බුදුදහම අනුව සමාජ අපචාරයකින් ගැබක් පිහිටියහොත් නැසිය යුතු වන්නේ, එකී සමාජ අපචාරයට අදාළ සමාජ සාධකය මිස ගැබට පැමිණි සත්ත්වයා නොවේ. එහෙත් නූතන ලෝකයේ විශේෂයෙන් බටහිර රටවල්වල ගබ්සාව සමාජගත වුවමනාවක් වන අතර නීතියෙන් ඊට අවසරය ද ඇත. මෙහි උණුසුම ශ්‍රී ලංකාව වැනි රටවලට දැනෙමින් පවතින අතර ඒ සඳහා මනුෂ්‍ය ඝාතනයෙන් තොර ගබ්සා කිරීමේ බෞද්ධ ප්‍රතිපදාවට යාමේ පසුබිම සැකසිය යුතුව ඇත. මනුෂ්‍ය මවකගේ කුස වධකාගාරයක් හෝ සුසානභූමියක් බවට පත් කිරීමේ ආගමික අයුක්තිය මෙන් ම වෛද්‍ය විද්‍යාත්මක හානිය ද මෙහි ලා හඳුනා ගැනීම අවශ්‍ය වේ.

**ප්‍රමුඛ පද ඃ** කලලය, ගබ්සාව, දූෂණය, ප්‍රාණඝාතය, මව